# ශ්‍රී ලංකාවේ ස්වයං රැකියා නියුක්තිකයන්ගේ ආර්ථික සමාජ පසුබිම කෙරෙහි කුසලතාවයන්හි බලපෑම තුලනාත්මකව අධ්‍යයනය කිරීම (මහර ප්‍රාදේශය ලේකම් කොට්ඨාශය ඇසුරින්)

ඩී. ඩී. තරින්දි[1]

***අභිමතාර්ථය 08:*** තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ සියලු දෙනාටම යහපත් රැකියාවක් ප්‍රවර්ධනය කිරීම.

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව වැනි අඩු ආදායම් ලබන රටක ස්වයං රැකියාව ප්‍රධාන රැකියා ක්‍ෂේත්‍රයකි. රැකියා අපේක්‍ෂකයන්ට සාපේක්‍ෂව විරැකියා තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය පෙළ, උසස් පෙළ අධ්‍යාපනය හැර යන සිසුන් නිසි අධ්‍යාපන ක්‍රමවේදකයකට යොමු නොවීම හේතුවෙන් ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය ස්වයං රැකියා ක්‍ෂේත්‍රය වේ. තවද විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබාගත් සිසුන් රැකියා ක්ෂේත්‍රයන්ට යොමු කිරීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම (Gunarathna, 2005) හේතුවෙන් මෙලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරන සිසුන්ද ස්වයං රැකියා ක්‍ෂේත්‍රයන්ට යොමු වෙමින් පවතියි. ශ්‍රී ලංකාවේ ස්වයං රැකියා ව්‍යාප්තිය පිළිබඳ සැලකීමේ දී වර්ෂ 1991 -2005 කාලය තුළ ඉතා සුළු උච්ඡාවචනයක් සහිතව ව්‍යාප්ත වන අතර 2006 - 2016 දක්වා කාලය තුළ ඉහළ ස්ථාවරව වර්ධනය වී තිබෙන අතර වර්ෂ 2016න් පසුව එහි ක්‍රමික අඩු වීමක් නිරීක්ෂණය කළ හැකිය (Department of Census and Statistics, 2019). 2020 වර්ෂයේ පළමු කාර්තුව වන විට ස්වයං රැකියාවක් කරන සේවා යෝජක පුද්ගලයන් ප්‍රමාණය සමස්ත ශ්‍රම බලකායට අනුව 202,933ක් ලෙසත්, තමන්ගේම රැකියාවක් කරන පුද්ගලයන් 2,663,080ක් ලෙසත් හා පවුලේ සාමාජිකයන් ලෙස ස්වයං රැකියාවේ නිරත වන පුද්ගලයන් 532,109 ලෙසත් ඇස්තමේන්තු කර තිබේ (Department of Census and Statistics, 2020). 2020 වර්ෂයේ පළමු කාර්තුවේදී කෘෂිකාර්මික ස්වයං රැකියා නියුක්තිකයින්ගෙන් 24%ක් පවුලේ සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර කෘෂිකාර්මික නොවන ස්වයං රැකියා නියුක්තිකයින්ගෙන් 10%ක ප්‍රතිශතයක් පවුලේ සාමාජිකයින්ගෙන් සමන්විත වේ (Department of Census and Statistics, 2020). කොවිඩ් වෛරස ව්‍යාප්තිය හේතුවෙන් රට වසාදැමීම නිසා කුඩා හා සුළු පරිමාණ ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා අහිතකර බලපෑමක් ඇතිව තිබේ. දැනට කුඩා පරිමාණයේ රැකියාවන් කොපමණ ප්‍රමාණයක් ඉවත් වී තිබේදැයි තක්සේරු කිරීම දුෂ්කරය. නමුත් කම්කරු දෙපාර්තුමේන්තුව ඇස්තමේන්තු කර ඇති පරිදි 52.15%ක් පමණ කුඩා ව්‍යාපාරවලින් ඉවත්වී ඇති බවට ගණනය කර තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනය ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා බලපාන ප්‍රධාන කුසලතාවන්

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
tharindidinuja@gmail.com

මොනවාද යන ගැටළුව ඔස්සේ ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා බලපාන ප්‍රධාන කුසලතාවයන් අධ්‍යයනය කිරීම අරමුණු කරමින් සිදුකර ඇත. අධ්‍යයනය සිදු කිරීමේදී කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් ද, රටේ පවතින ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් ප්‍රවාහන ඇතුළු අත්‍යවශ්‍ය සේවා හිඟ වීම යන සීමාවන්ට යටත්ව ශ්‍රී ලංකාවේ ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා බලපාන ප්‍රධාන කුසලතාවයන් කවරේදැයි හඳුනා ගන්නා ලදී.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

බස්නාහිර පළාත තුළ විවිධ ක්ෂේත්‍රයන් ඇසුරින් ස්වයං රැකියාවන්හි නිරතවන පුද්ගලයින් සිටින බැවින් බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගන්නා ලදී. එසේම සරල සසම්භාවී නියැදුම් ක්‍රමය මඟින් නියැදි ඒකක 110ක් ප්‍රශ්නාවලි ක්‍රමය ඇසුරුන් දත්ත රැස්කරගන්නා ලදී. ශ්‍රී ලංකාවේ ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා බලපාන ප්‍රධාන කුසලතාවයන් කවරේදැයි හඳුනා ගැනීම සඳහා සාධක විශ්ලේෂණය යොදාගෙන තිබේ.

## 3. දත්ත විශ්ලේෂණය

මේ සඳහා සාධක විශ්ලේණය භාවිතා කර තිබෙන අතර සාධක නිස්සාරක ක්‍රම (Factor Extraction Methods) ලෙස Principal Axis Factoring ක්‍රම භාවිතා කර තිබෙන අතර Factor Rotation Method ලෙස Varimax ක්‍රමය යොදාගෙන තිබේ. වගු අංක 1 ට අනුව Bartlett’s පරීක්ෂාව මඟින් සහසම්බන්ධතා න්‍යාසය 1 නොවන බව තහවුරුවේ. Bartlett’s පරීක්ෂාවෙහි $\text{sig} = 0.000 < 0.05$ වන බැවින් සාධක විශ්ලේෂණය සඳහා ප්‍රමාණවත් තරම් නියැදි තරමක් මෙහි තිබෙන බවට නිගමනය කළ හැකිය.

වගු අංක 1: Bartlett’s පරීක්ෂාව

| Type of Factor extraction and Factor Rotation Method | | Principal Axis Factoring+Varimax |
|---|---|---|
| Kaiser-Meyer-Olkin Measure of Sampling Adequacy. | | .860 |
| Bartlett's Test of Sphericity | Approx. Chi-Square | 1711.573 |
| | df | 153 |
| | Sig. | .000 |


*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

ප්‍රස්තාර සටහන 1ට අනුව පළමු ප්‍රමුඛ සාධකය සඳහා $Q_2, Q_{16}$ ධනාත්මකව බලපෑමක් සිදුකර තිබේ. ඒ අනුව මෙම සාධකය සංවිධානාත්මකභාවයක් පැවතීම ලෙස නම් කළ හැකි අතර ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා

සංවිධානාත්මකභාවය ඉතා වැදගත් කුසලතාවයක් බව සැලකිය හැකිය. මෙම වගුවට අනුව දෙවන සාධකය (Component 2) අවදානම් හඳුනාගැනීම ලෙස නම් කළ හැකිය. මේ සාධකය සඳහා $Q_{11}, Q_{10}, Q_{13}, Q_{18}$ ධනාත්මක ව බලපෑමක් සිදුකර තිබේ. එනම් ස්වයං රැකියා නියුක්තිකයින්ගේ අවදානම් හඳුනාගැනීමේ හැකියාව සඳහා ඉහත දැක්වූ විචල්‍යයන් පිළිබඳ අවධානය යොමු කළ යුතු බව නිගමනය කළ හැකිය.

මෙහි තුන්වන සාධකය (Component 3) සඳහා $Q_{14}, Q_{17}, Q_5, Q_9$ යන විචල්‍යයන් ධනාත්මක බලපෑමක් සිදුකර තිබේ. ඒ අනුව මෙම සාධකය ව්‍යාපාරික කුසලතාවන් ලෙස නම් කළ හැකිය. හතරවන සාධකය (Component 4) සඳහා $Q_{15}$ හා $Q_1$ යන විචල්‍යයනන් ධනාත්මකවත් $Q_4$ විචල්‍යය සෘණාත්මකවත් බලපා තිබේ. ඒ අනුව මෙම සාධකය ගණුදෙණු කළමනාකරණ හැකියාව ලෙස නම් කළ හැකිය. පස්වන සාධකය (Component 5) ක්‍රියාවලි කළමනාකරණ හැකියාව ලෙස නම් කළ හැකිය. මෙම සාධකය සඳහා $Q_{12}, Q_6, Q_3$ ධනාත්මකව බලපා තිබේ. හයවන සාධකය (Component 6) සඳහා $Q_7$ හා $Q_8$ විචල්‍යයන් ධනාත්මකව බලපා තිබෙන බැවින් මෙම සාධකය මූල්‍ය කටයුතු කළමනාකරණය ලෙස නම් කළ හැකිය. ඒ අනුව ස්වයං රැකියා නියුක්තිකයින් සතුව පැවතිය යුතු ප්‍රධාන කුසලතාවයන් ලෙස සංවිධානාත්මක බව, අවදානම් හඳුනාගැනීම, ව්‍යාපාරික කුසලතා, ගණුදෙණු කළමනාකරණ හැකියාව, ක්‍රියාවලි කළමනාකරණ සහ මූල්‍ය කටයුතු කළමනාකරණය දැක්විය හැකිය.

ප්‍රස්තාර සටහන 1: Scree Plot




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

වගු අංක 2: ප්‍රමුඛ සංරචක වගුව

| | ප්‍රමුඛ සංරචක | | | | | |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| ගණුදෙණුකරුවන්ගේ අපේක්ෂා කරන භාණ්ඩ හෝ සේවා ලබාදී තිබේ (Q14) | -.860 | -.191 | **-.133** | | | |
| ස්වයං රැකියාව සඳහා මූල්‍යමය යෙදවුම් කිරීමට නොහැකි වූ විට ඒ සඳහා විකල්ප මාර්ග භාවිතා කර තිබේ (Q12) | -.705 | -.170 | -.145 | | **.144** | .118 |
| ස්වයං රැකියාව සඳහා අනාගත ඉලක්කයක් හා සැලසුමක් තිබේ (Q2) | **.704** | .555 | .125 | | -.133 | .129 |
| තමාගේ ක්ෂේත්‍රය හා සම්බන්ධ අනෙකුත් ස්වයං රැකියා කරන්නන් පිළිබඳ අවබෝධයක් තිබේ (Q16) | **.515** | .385 | .190 | | -.177 | |
| අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වූ විට ඒ සඳහා ආදේශක භාවිතා කර තිබීම හෝ ඉල්ලුමක් නොමැති වූ විට ඒ සඳහා විකල්ප ක්‍රම භාවිතා කර තිබේ (Q11) | .350 | **.664** | .149 | | | |
| කොවිඩ් වෛරස ව්‍යාප්තියට පෙර ස්වයං රැකියාව සඳහා නව යන්ත්‍ර සූත්‍ර නව උපකරණ හෝ නව භූමියක් මිලට ගෙන තිබේ (Q10) | .110 | **.576** | | | -.126 | .229 |
| ගණුදෙණුකරුවන්ගේ ආකර්ෂණය සඳහා උපක්‍රම භාවිතා කර තිබේ (Q15) | -.428 | -.436 | .141 | **.147** | .336 | -.170 |
| ස්වයං රැකියාව සිදුකරන භූමිය ගොඩනැගිලි යන්ත්‍රසූත්‍ර සඳහා රක්ෂණාවරණයක් තිබේ (Q13) | .105 | **.418** | .120 | | | |
| ස්වයං රැකියාව සිදුකිරීම සඳහා සමාජ මාධ්‍ය පරිශීලනය කර තිබේ (Q18) | .312 | **.379** | .215 | -.187 | -.201 | -.119 |
| ස්වයං රැකියාවේ ප්‍රචාරණ කටයුතු සඳහා විද්‍යුත් මාධ්‍ය හෝ සමාජ මාධ්‍ය භාවිතා කර තිබේ (Q17) | .311 | .201 | **.557** | | -.169 | |
| පාරිභෝගික යෝජනා හෝ ගැණුම්කරුවන්ගේ යෝජනා ලබාගෙන තිබේ (Q5) | .166 | | **.223** | .177 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කොවිඩ් වෛරස ව්‍යාප්තියට පෙර ස්වයං රැකියාව මඟින් ලැබෙන ආදායමින් සුළු මුදලක් ඉතිරි කිරීමේ ගිණුමකට බැර කිරීමට හැකිවේ (Q9) | | | **.209** | | | |
| ස්වාධීනව තීරණ ගැනීමට තමා තුළ හැකියාවක් පවතී (Q1) | | | | **.631** | .102 | |
| ස්වයං රැකියාව සිදු කිරීමත් සමඟ නිවසේ කටයුතු හෝ අධ්‍යාපන කටයුතුවල නිරතවීමට හැකිය (Q4) | | | | **-.196** | | |
| පාරිභෝගිකයින්ගේ හෝ ගැණුම්කරුවන්ගේ අවශ්‍යතාවය පරිදි භාණ්ඩ හෝ සේවා සැපයීමට හැකියාව පවතියි (Q6) | | -.103 | .173 | -.275 | **.412** | .189 |
| ස්වයං රැකියාව ඉදිරියට සිදු කරගෙන යාම සඳහා තමා තුළ ආත්ම විශ්වාසයක් පවතියි (Q3) | | | | | **.316** | |
| ස්වයං රැකියාව සඳහා මාසිකව අයවැය ලේඛනයක් පවත්වාගෙන යාම සිදුකරයි (Q7) | | | .132 | -.169 | | **.363** |
| ස්වයං රැකියාව සඳහා මූල්‍ය බැංකුවකින් ණය ලබාගෙන තිබේ (Q8) | | | | | | **.260** |

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

### 4. සමාලෝචනය

අධ්‍යයනයේ අරමුණුවලට අනුව ස්වයං රැකියා නියුක්තිකයින්ගේ රැකියාවට බලපාන ප්‍රධාන කුසලතාවයන් අධ්‍යයනය කිරීමේදී සංවිධානාත්මක බව, අවධානම් හඳුනාගැනීම, ව්‍යාපාරික කුසලතා, ගණුදෙණු කලමනාකරණ හැකියාව, ක්‍රියාවලි කළමනාකරණ හැකියාව සහ මූල්‍ය කටයුතු කළමනාකරණය යන කුසලතා ප්‍රධාන වශයෙන් බලපාන බව නිගමනය කළ හැකිය. ස්වයං රැකියා නියුක්තිකයිගේ කුසලතාවය වර්ධනය සඳහා ආකල්ප සංවර්ධනය කළ යුතුය. එහි ප්‍රධාන පියවර වශයෙන් පාසල් අධ්‍යපනය ලබන සිසුන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම වැදගත් වන බව නිගමනය කළ හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ

Department of Census and Statistics. (2020). *Sri Lanka Labour Force Statistics Quarterly Bulletin.* Ministry of Finance, Economy and

policy Department. Retrieved on 20th Januaray, 2022 from http://www.statistics.gov.lk

Department of Census and Statistics. (2019). *Sri Lanka Labour Force Statistics Quarterly Bulletin.* Ministry Of Finance, Economy and policy Department. Retrieved on 21st December, 2021 from http://www.statistics.gov.lk

Gunarathna, K.M.L.M. (2005). Unemployment and Vocational training (A Study of the Sri Lankan Experience). Peoceedings of the Annaul Reearch Aymposium 2005. Faculty of Graduate Studies. University of Kelaniya.

Hundley, G. (2006, October 1). Male/Female Earnings Differences in Self-employment: The Effects of Marriage, Children and the Household Division of Labor. *The Journal of Socio-Economics, 35*(5), 759-779. Retrieved on 23rd November, 2021 from https://doi.org/10. 1016j.socec.2005.11.034

International Labour Organization [ILO] and Economic Co-operation and Development[OECD]. (2020). Ensuring better social protection for self-employmed workers. *2nd Meeting of the G20 Employment Working Group under Saudi Arabia's presidency.* Retrieved on 13th December, 2021 from https://www.ilo.org

Sanchez, J. A., Serrano, L. D., & Teruel, M. (2015, April). Is Self-employment away to Escape from Skill Mismatches. Retrieved on 13th December, 2021 from https://scholar.google.com

Tolentino, M. A., Tolentino, C., Galang, B. M., & Arcenal, X. Z. (2019). *to end hunger and poverty SUSTAINABLE FAMILY FARMING AGRICULTURE IN SOUTH ASIA THROUGH PARTNERSHIPS* (Vol. 9). (M. E. Penunia, Ed.) Asian Farmers' Association for Sustainable Rural Development(AFA).

Ummah, S. (2009). Entrepreneurial Motivation and Self-employment Intention: AnEmpirical Study on Management Undergraduates in Sri lanka. Retrieved on 24th January, 2022 from https://scholar.google. com

Williams, C. C., & Lapeyre, F. (2017). *Dependent self-employment:Trends, challenges and policy responses in the EU.* Department and Investment Branch, Employment policy Department. International Labour Organization. Retrieved on 25th February, 2022 from https://www.ilo.org